# පොත්ගුල් ලෙන සහ පොතාන ප්‍රාග් ඓතිහාසික මානවයාගේ සත්ත්ව වරණය

**කේ. එච්. සොනාලි රංගිකා ප්‍රේමරත්න, කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි හා ගාමිණී අදිකාරි**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, කොළඹ
*onlinecss.kelum@gmail.com

## හැඳින්වීම

තෙත් කලාපීය ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථානයක් සහ වියළි කලාපීය ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථානයක් කැනීම් කොට අනාවරණය කර ගත් සත්ත්ව අවශේෂ අනුසාරයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ සත්ත්ව විශේෂ වරණය පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මේ සඳහා තෙත් කලාපය තුළ පිහිටි ශ්‍රී ලංකාවේ බටහිර පෙදෙසේ ස්ථානගත ව ඇති ගම්පහ දිස්ත්‍රික්කයේ අලවල පොත්ගුල් ලෙන ප්‍රාග් ඓතිහාසික කැනීමෙන් ලද සත්ත්ව අවශේෂත්, වියළි කලාපයේ (මෙය අන්තර් කලාපය තුළ වියළි කලාපයේ මායිමට ආසන්නයේ පිහිටා ඇති බව දැක්වීම ද නිවැරදි වේ.) පිහිටි සීගිරියට ආසන්නයේ වූ පොතාන ප්‍රාග් ඓතිහාසික ගුහා කැනීමෙන් ලද සත්ත්ව අවශේෂද පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙහි දී මූලික වශයෙන් එකිනෙකට වෙනස් දේශගුණික කලාප දෙකකට ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයින් තමා ජීවත් වූ අවට පරිසරයෙන් දඩයම් කොට හෝ එකතු කොට තම ආහාරයට එක් කර ගත් සතුන් පිළිබඳ ව මූලික වශයෙන් කරුණු ගොනු කොට ඇත. එම මානවයින් එකිනෙක පරිසරයන් තුළ දී තම ආහාරය සඳහා සතුන් දඩයම් කොට හෝ එකතු කොට ඇත්තේ යම් වරණයකට නතු ව බැව් සනාථ වී ඇත. එය ප්‍රධාන වශයෙන් තම පරිසරයේ ජීවත් වූ සත්ත්ව විශේෂ, උන්ගේ ගහණ සනත්වය, දඩයම් කිරීමට ඇති පහසුව ආදී කාරණා හේතු වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. මානව පරිණාමය තුළ ඔවුන්ගේ වැඩි රුචිකත්වය කුර සහිත සතුන් බහුල පෙදෙස්වල වාසය කරමින් උන් දඩයම් කළ බවට සමස්ත ප්‍රාග් ඉතිහාසය තුළ අපමණ උදාහරණ ගෙනහැර දැක්විය හැකි ය. සරලව දක්වතොත් මෙම සිදුවීම යැපීම් ධාරිතාව යන විෂය තුළින් සාකච්ඡා කළ හැකි ය.

## ක්‍රමවේදය

ප්‍රාග් ඓතිහාසික සත්ත්ව අවශේෂ හඳුනා ගැනීමේ දී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේත්, කොළඹ ජාතික කෞතුකාගාරයේත් තැන්පත් කොට ඇති සංසන්දනාත්මක අස්ථි එකතුන්වල සහාය ලබා ගන්නා ලදී. කුඩා අස්ථි හා දත් අවශේෂ හඳුනාගැනීමේ දී විශාලනය 10x20 සහිත අන්වීක්ෂයක් භාවිත කළ අතර අනෙකුත් කොටස් හඳුනා ගැනීමේ දී අත් කාචයක් උපයෝගී කර ගන්නා ලදී. වාර්තාකරණය සහ වැඩිදුර අධ්‍යයන සඳහා megapixel 1 7.2 වූ අංකිත කැමරාවක් ඇසුරෙන් තෝරාගත් නිදර්ශක ඡායාරූප ගත කරන ලද අතර මිණුම් ලබා ගැනීමේ දී දශම ස්ථාන 2ක් සහිත අංකිත කැලිපරයක් (digital Caliper) භාවිත කරනු ලැබිණි.

## පර්යේෂණ ප්‍රතිඵල

අර්ධ සදාහරිත වනාන්තර හෙවත් මෝසම් වන ආවරණයක් තුළ පිහිටි පොතාන ප්‍රාග් ඓතිහාසික ලෙන අංගාර කාලනීර්ණයන්ට අනුව අදින් වසර 6000ක් අතීතයට දිවෙන බැව් පුරාවිද්‍යාත්මක ව සනාථ වී ඇත. වර්තමානයේ මෙම පරිසරය මුළුමනින් ම පාහේ වියළි කලාපීය ලක්ෂණ දරනු ඇත. පහත දක්වා ඇත්තේ පොතාන ලෙනෙහි

ප්‍රාග් ඓතිහාසික සංදර්භ අතරින් අනාවරණය කොටගත් පෘෂ්ඨවංශී සත්ත්ව විශේෂයන් ය. මෙහි දී මූලික අවධානය ක්ෂීරපායීන්, පක්ෂීන් හා උරගුන් වෙත යොමු කරන ලද්දේ එම විශේෂ මනා ලෙස හඳුනා ගැනීමට හැකි වූ බැවිනි. එම සත්ත්ව විශේෂ නම්, මා වවුලා (*Pteropus giganteus*), හැළි වඳුරා (*Semnopithecus priam*), කළු වඳුරා (*Semnopithecus vetulus*), රිළවා (*Macaca sinica*), කබල්ලෑවා (*Manis crassicaudata*), වල් හාවා (*Lepus nigricollis*), කොටියා හෙවත් දිවියා (*Panthera pardus*), හඳුන් දිවියා (*Prionailurus viverrinus*), මුගටීන් සහ හෝතඹුවන් (*Herpestes* spp.), දියබල්ලා, (*Lutra lutra*), කළවැද්දා, (*Paradoxurus* spp.), උගුඩුවා, (*Paradoxurus hermaphroditus*, උරුලෑවා, (*Viverricula indica*), අලියා, (*Elephas maximus*), ගවයා, (*Bos* sp.), වල් මීමා, (*Bubalus arnee*), මී හරකා (*Bubalus bubalis*), ගෝනා, (*Rusa unicolor*), වැලි මුවා (*Muntiacus muntjack*), වල් ඌරා, (*Sus scrofa*), මීමින්නා, (*Moschiola* sp.), ඉත්තෑවා, (*Hystrix indica*), මාහම්බාවා, (*Petaurista philippensis*), දිඬුලේනා, (*Ratufa macroura*), ශ්‍රී ලංකා වළිකුකුළා (*Gallus lafayetii*), මොණරා (*Pavo cristatus*), පිඹුරා (*Python molurus*), ගල් ඉබ්බා (*Melanochelys trijuga*) සහ කිරි ඉබ්බා (*Lissemys punctata*) ද වේ.

තෙත් කලාපයේ පහතරට වැසි වන ආවරණයක් තුළ පිහිටි පොත්ගුල් ලෙනෙහි ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික ස්තර අදින් වසර 14,000-8,000 දක්වා කාලනීර්ණය වී ඇත. පොත්ගුල් ලෙන ගුහාවෙන් ලද සත්ත්ව අවශේෂ අතරින් එහි ජීවත් වූ මානවයාගේ රුචිකත්වය වී ඇත්තේ ප්‍රධාන වශයෙන් කුඩා ක්ෂීරපායීන් වේ. සමස්ත ක්ෂීරපායීන් අතරින් 25%ක පමණ නියෝජනයක් කළු වඳුරන් හා රිළවුන් වන අතර හම්බාවන්, දිඬු ලේනුන්, උරුලෑවන් හා උගුඩුවන් වැනි කුඩා ක්ෂීරපායී ද පොත්ගුල් ලෙන විසූ ප්‍රාග් ඓතිහාසික මානවයින් තම ආහාරයට බහුල ව එක් කොට ගෙන ඇති බැව් හමු ව ඇති සත්ත්ව අවශේෂ මඟින් සනාථ වී ඇත. මෙය එම ලෙනට පමණක් නොව තෙත් කලාපය තුළ පිහිටි අදින් වසර 38,000ක ඉතිහාසයක් ඇති බුලත්සිංහල පිහිටි ෆා-හියන් ලෙන, අදින් වසර 37,000ක් පැරණි කුරුවිට බටදොඹ ලෙන සහ අදින් වසර 31,000ක් පැරණි කිතුල්ගල බෙලි ලෙනෙහි ද මේ ආකාර රටාවක් ඇති බැව් එම ගුහාවලින් ලද සත්ත්ව අවශේෂ හඳුනා ගැනීමේ දී සනාථ වී ඇත (අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි 2012).

පොතාන ප්‍රාග් ඓතිහාසික මානවයා කුඩා ක්ෂීරපායීන් තම ආහාරයට එක් කොට ගත්ත ද ඔහුගේ වැඩි රුචිකත්වය තිත් මුවන්, ගෝනුන්, වල් ඌරන්, කුළු හරකුන් සහ හරකුන් වෙත යොමු වී ඇති බව එම වියළි කලාපීය ගුහාවෙන් ලද සත්ත්ව අවශේෂවලින් සනාථ වේ. මෙරට යැපීම් ධාරිතාව සළකා බැලූ කළ තෙත් කලාපයේ වූ වැසිවනාන්තරවලට වඩා වියළි කලාපයේ තැනිතලා බිම්වල ඉහළ අගයක් දරනු ඇත (Deraniyagala 1992).

### ආශ්‍රෙය ග්‍රන්ථ


Adikari, G., 1998. Aspect of the Prehistory of the Sigiriya-Dambulla region. Unpub. thesis submitted for the degree of Master of Philosophy (M. Phil.) PGIAR, University of Kelaniya: 443 pp.

අදිකාරි, ජී. සහ කේ. මනමේන්ද්‍ර-ආරච්චි. 2012. ප්‍රාග් ඓතිහාසික අලවල පොත්ගුල් ලෙන. ආචාර්ය පී.ඊ.පී. දැරණියගල 39 වන ගුණානුස්මරණය වෙනුවෙන් පැවැත්වූ පුරාජෛවවිවිධත්ව සමුළුව, 2012, පර්යේෂණ ලිපි සහ තොරතුරු පත්‍රිකා එකතුව. ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය; මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික අමාත්‍යාංශය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය: පිටු 140-213.

Deraniyagala, S.U. 1992. The Prehistory of Sri Lanka: an ecological perspective. Memoir 8, 2nd ed. Archaeological Department, Colombo, 831 pp.

දැරණියගල, සි. 2003. ප්‍රාග් ඓතිහාසික සබරගමුව (බලංගොඩ සංස්කෘතිය). සබරගමුව වංශ කතාව (විධායක සංස්කාරක: අදිදගම, ප.), සබරගමුව පළාත් සභාව, පිටු 193-221.

කරුණාරත්න, එම්., කේ.එන්. මනමේන්ද්‍ර-ආරච්චි, ගා. අදිකාරී. 2012. සීගිරියේ පොතාන ප්‍රාග් ඓතිහාසික ගුහාවෙන් හමුව ඇති ක්ෂීරපායී සතුන්.

වසර 2012 ජාතික පුරාවිද්‍යා සමුළුවට ඉදිරිපත් කළ ශාස්ත්‍රීය ලිපි එකතුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ, 1 වන වෙළුම.

Manamendra-Arachchi, K.N., J. Perera, W.S. Weliange, A. Thantilage, W. Karunaratne, G. Adikari & N. De Silva. 2009b. Checklist of fauna in the excavation of prehistoric Alavala Potgul-lena cave. Hunting for hunter-gatherers at Alavala cave, Symposium on new discoveries from the excavation at Alavala, 3rd Nov. 2009, abstracts (editor in- chief De Silva, N), Postgraduate institute of Archaeology, University of Kelaniya: 47-51 pp.

Perera, H.N. 2010. Prehistoric Sri Lanka, late Pleistocene rockshelters and an open-air site. BAR International Series, 2142, xvi+268 pp.